ප්‍රායෝගික කෘෂිකර්මය

# ගෝවා වවමු

**පරතරය**

කුමන ආකාරයකට ක්ෂේත්‍රය සකස් කරගෙන තිබුණත්, පහත සඳහන් නිර්දේශිත පරතරයන් භාවිතා කිරීම වැදගත් වේ. ලංකා ගෝවා ප්‍රභේදය සඳහා පමණක් පේලි අතර, සෙ.මී. 40 හා පේලියේ පැල අතර, සෙ.මී. 40 පරතරයක් දෙනු ලැබේ. සෙසු ප්‍රභේද සඳහා පේලි අතර, සෙ.මී. 50 ට හා පේලි පැල අතර, සෙ.මී. 40 ක පරතරයක් ලබා දෙනු ලැබේ.

**වල් මර්ධනය**

වල් මර්ධනයේදී ගෝවා පැල අවට ඇති වල් පැල ගලවා හෝ උදළු ගා ඉවත් කල යුතු වේ. මතුපිට පොහොර යෙදීමට පෙර වල් මර්ධනය කල යුතුවේ. ගෝවා පැලවල මුල පද්ධතිය පස මතුපිට විහිදී ඇති බැවින් වල් මර්ධනයට ගැඹුරට කෙටීමෙන් වැලකිය යුතුවේ.

**ජල සම්පාදනය**

තවාන් පැල ක්ෂේත්‍රයේ සිටුවා පළමු දින හතරේ දිනපතා ජලය සැපයීම කල යුතුවේ. ඉන්පසු දින දෙකකට වතාවක් ජලය සැපයීම කල හැකි වේ. සති දෙකකට පසුව දින 4 කට වරක් ජලය සැපයීම ප්‍රමාණවත් වේ. භෝගය අවසානයේදී තද නියඟයට හෝ හදිස්සියේ තද වර්ෂාවක් ඇති වුව හොත් ගෙඩි පිපිරීම සිදුවියහැකිය.

මූලික පොහොර සඳහා 14:21:14 එන්.පී.කේ. මිශ්‍රණයෙන් කි. ග්‍රෑම් 250 අක්කරයකට නිර්දේශ කර ඇත. මතුපිට පොහොර යෙදීම පැල සිටුවා සති 4–5 පසු සිදු කල යුතුයි. මතුපිට පොහොර ලෙස යූරියා කි.ග්‍රෑ. 100 ක් අක්කරයකට යෙදීමට නිර්දේශිතයි.

**පලිබෝධ මර්ධනය:**

**1. ඩයමන්ඩ් බැලැක්බෝන් කීටයාගේ (දළඹුවාගේ) හානිය**

මෙම කීටයාගේ (දළඹුවාගේ) වැඩුනු සතා සලබයෙකි. බිත්තර තනි තනිව දමයි. පත්‍ර මත ඇති බිත්තර වලින් කීටයින් බිහිවේ. වැඩුනු කීටයා අඳුරු කොළපාට වන අතර, පූර්ව කෙලවර දුඹුරු පැහැයක් ගනී. කීටයා අවධියෙන් පසු පිලවෙක් බවට පත්වන අතර පිලවා අවධිය අවසානයේදී පිලවා කෝෂයෙන් සලබයෙක් බිහිවේ. කීටයා පත්‍ර කා දමන අතර, පත්‍ර මැළවී යයි. පත්‍ර සිදුරු සහිත වන අතර, කීටයන්ගේ මළ ද්‍රව්‍ය පසෙහි දැකිය හැක. කෘමි හානිය මර්ධනය සඳහා මෙනුම්ඩපොස් 60% සාන්ද්‍ර තෛලෝදනය (වෙළෙඳ නම ටැමරෝන්) සන සෙන්ටි මීටර් 700–840 අතර ප්‍රමාණයක් හෙක්ටයාර් එකකට යෙදීම හෝ ක්විනොල්පොස් 25% සාන්ද්‍ර තෛලෝදය (වෙළඳ නම් බෙරු සීල් හා එකලස්) සන සෙ.මී. 1,400–2,100 අතර ප්‍රමාණයක් හෙක්ටයාර් එකකට යෙදීම හෝ මොනකොටපොස් 60% සාන්ද්‍ර තෛලෝදය (වෙළෙඳ නම නුවක්‍රෝන්, ඇසෝඩ්‍රින් හා මොනකොටපොස්) සන සෙන්ටි මීටර් 1,400 – 2,100 අතර ප්‍රමාණයක් හෙක්ටයාර් එකකට යෙදීම හෝ ප්‍රොපෙනොපොස් 50% සාන්ද්‍ර තෛලෝදනය (වෙළඳ නම සෙලික්‍රෝන්) සන සෙ.මී. 1,050–1,400 අතර ප්‍රමාණයක් හෙක්ටයාර් එකකට යෙදීම නිර්දේශිතයි. පත්‍ර හොඳින් තෙමෙන සේ කෘමි නාශක යෙදිය යුතුවේ. මොනක්‍රොටපොස් භාවිතා කරන්නේ නම් අස්වනු නෙලීම සති 4 කට පෙර නැවැත්විය යුතුවේ.

**2. ගෝවා පත්‍ර දූල් දළඹුවා (හෙළියුලා අණ්ඩාලිස්)**

කුඩා සුහුඹුල් සලබයා අඳුරු කහ පාටය. කීටයා (දළඹුවා) අළු කහ පැහැයක් ගනී. කීටයාගේ ශරීරයේ දුඹුරු දම් පැහැති දිග අතට වැටුනු ඉරි සහිත වේ. පත්‍ර වල යටිපස හා ශාඛයේ අනෙක් කොටස් වල බිත්තර දමයි. කීටයන් පත්‍ර හා ප්‍රරෝහ විද ඒ තුලට ගොස් ඒ මත පෝෂණය වේ. අවසානයේ ගෝවා ගෙඩිය තුලම හෝ කඳ තුලට විද යයි. පත්‍රවල කීටයා ජීවත් වන කොටස් දිලිසෙන සුළුය. පිලවා අවධිය කෝෂය තුල ගතවේ. මෙම කීටයාගේ හානියට භාජනය වූ ගෙඩි ආහාරයට ගැනීමට නොහැකි වේ. මර්ධනය ඩයමන්ඩ් බැලැක්මොක් කීටයාගේ හානිය මර්ධනය කිරීමට සමානය.

**3. දුඹුරු පැහැති කියත් පණුවාගේ හානිය. (අග්රොටස් සිප්සිලෝන්)**

සලබයාගේ පූර්ව පියාපත් දම් පැහැතිවන අතර, අළු පාට පැල්ලම් හා ඉරි ඇත. බිත්තර පස මත

හෝ නෙත් පසේ දමයි. කීටයා (පණුවා) තද දුඹුරු පාට වන අතර, ශරීරය මහතය. ලිස්සන සුළුවන ඉතර, දිලිසෙන පෙනුමක් ඇත. දිවා කාලයේ පසයට සැඟවී සිටින කීටයන් (පණුවන්) රාත්‍රී කාලයේ පස මතු පිටට පැමිණේ. කුඩා ගෝවා පැල පස මට්ටමෙන් කපා දැමීම හෝ ගෝවා පත්‍රවලට හානි කිරීමට රාත්‍රී කාලයේ දී කීටයා විසින් සිදු කරයි. කීටයාට බාධාකල විට හැකිලේ. සමහර විට කීටයා (පණුවා) ගෝවා ගෙඩි විදීමටද පුළුවන. පිලා අවධිය පසේ ගත කරන අතර, පිලව අවධිය අවසානයේ දී සලබයෝ බිහිවේ.

මර්ධනය සඳහා හොඳින් කීප විටක් බිම් පෙරලා ගැනීමෙන් හා ක්ෂේත්‍රය ජලයෙන් යටකර තැබීමෙන් පසේ ජීවත් වන පිලවා අවධි හා කීට අවධි විනාශ කල හැක. මර්ධන සඳහා ප්‍රෙපෙනො පොස් 50% යාන්ද්‍ර තෛලෝදය (වෙළඳ නම සෙලික්‍රෝන්) සහ සෙන්ටි මීටර් 1,050—1,400 අතර ප්‍රමාණයක් යෙදීම නිර්දේශිතයි. මෙම කෘමි නාශක පැල වලට යෙදීම හා පැල අවට යෙදීම උදේ හෝ තරමක් හවස් වී කරන් නේ නම් හොඳ ප්‍රතිඵල ලබා ගැනීමට හැකිවේ.

## රෝග මර්ධනය

### 1. ගෝවා බරවා රෝගය (ප්ලාස්-මිඩ්පොරා බැසිකේ දිලීරය)

උඩරට අම්ලික පසේ ගෝවා වගා කරන විට මෙම රෝගය සුලභය. තවානේදී හෝ ක්ෂේත්‍රයේදී රෝගය වැළඳිය හැක. තවාන් පැලවල රෝග ලක්ෂණ ලෙස දක්නට ලැබෙන්නේ මූල ස්වල්ප වශයෙන් ඉදිමී තිබීමයි. ක්ෂේත්‍රයේ රෝග ලක්ෂණ ලෙස දක්නට ලැබෙන්නේ සිටුවන ලද කුඩා ගෝවා පැල අධික ලෙස මිය යෑම, ලා කහ පැහැති පත්‍ර තිබීම, ගෝවා පැලේ වර්ධනය බාලවීම, ගෝවා ගෙඩි වර්ධනය නොවීම, දිවා කාලයේ පමණක් රෝගී පැල මැලවීම හා රෝගී පැල ගලවා පරීක්ෂා කල විට මූල පද්ධතිය ඉදිමී ගැට සහිත වීම ආදියයි.

මෙම රෝග කාරක දිලීර ආම්ලික පසේ ජීවත් වේ. මෙම රෝග කාරක දිලීරය ඇති ක්ෂේත්‍රයක ඉක්මනින් හා සම්පූර්ණයෙන් රෝග කාරක දිලීරය මර්ධනය කිරීමේ ක්‍රමයක් තවම සොයාගෙන නැත. ක්‍රමවත් දිගු කාලින බෝග මාරුවක්, පසේ ආම්ලිකතාව අඩු කිරීම හා ක්ෂේත්‍රයේ පිරිසිදු

---

නුවරඑළිය දිස්ත්‍රික් ගොවි පුහුණු මධ්‍යස්ථානයේ
කෘෂිකර්ම නිලධාරි
**පී. කේ. කේ. ආර්. පෙරේරා**
විසිනි.

---

තාවය සැලකිලිමත් වීමෙන් ක්‍රමයෙන් රෝග කාරක දිලීරය පසේ අඩුකර ගැනීමට හැකිවේ. මේ නිසා නිරෝගී ඉඩම්වලට රෝග කාරක දිලීර පැමිණීම වලකා ගත යුතු අතර, ක්ෂේත්‍රයේ තැනින් තැන රෝග කාරක දිලීරය පෙන්නුම් කරන්නේ නම් වහාම රෝග පැතිරීම මර්ධනය සඳහා කටයුතු කලයුතු වේ.

නිරෝගී ගෝවා තවාන් පැල ක්ෂේත්‍රයේ සිටුවීම ඉතා වැදගත් වේ. රෝගී පැල ඔස්සේ රෝගී තවානක සිට නිරෝගී ක්ෂේත්‍රයට රෝගය පැතිර යා හැක. තවානේ රෝග කාරක දිලීර විනාශ කිරීමට තවාන් ගිණි තැබීම, පාංශු දිලීර නාශක මගින් තවාන් පාත්තිවලට ප්‍රතිකාර කිරීම හා තවාන් වල පසේ ආම්ලිකතාව අඩු කිරීමට හුනු හෝ ඩොලමයිට් යෙදීම කල යුතුවේ. (ගෝවා තවාන් පාලනය බලන්න.)

නිරෝගී පැල සිටුවීමට භාවිතා කිරීම, දිගු කාලින ක්‍රමවත් බෝග මාරුවක් ඇති කිරීම හා පැල සිටුවීමට පෙර ක්ෂේත්‍රයේ පසේ ආම්ලිකතාවය අඩු කිරීමට පියවර ගැනීම මගින්, ක්ෂේත්‍රයට රෝග ඇතුල්වීම හා ක්ෂේත්‍රයේ රෝග පැතිරීම අඩුකර ගත හැක. ක්ෂේත්‍රය මනාව සකසා පැල සිටුවීම සති 1–2 කට පෙර පැල සිටුවන පේලි දිගේ අක්කරයකට ටොන් 1 ක් වන සේ අළුහුනු යෙදීම රෝගය වලකා ගැනීමට ආධාරවේ. රෝගී පැල සියළුම මුල් කොටස් සමඟ ගලවා ගැඹුරට වැලලීම හෝ ගිණි තබා පිළිස්සීම කල යුතුවේ.

### 2. මයිකස් පෙරෙල්ලා පුල්ලි රෝගය (මයිකස් පොරා බ්‍රැසිකේ දිලීරය)

ක්ෂේත්‍රයේ වර්ධනය වෙමින් පවතින ගෝවා පැල ඕනෑම වර්ධන අවධියකදීම මෙම රෝගය වැළඳිය හැක. ලපටි පැල වලට රෝගය වැළඳුන හොත් නිසි පියවර ගත යුතු අතර, නැතහොත් අස්වනු අඩුවීමේ හානිය අධික වේ. නමුත් ගෝවා ගෙඩි හොඳින් වර්ධනය වූ පසු ගෝවා ශාක වලට මෙම රෝගය වැළඳුන හොත්, අස්වනු වලට සිදුවන හානිය අඩුවේ. දුඹුරු පාටට හුරු කහ පුල්ලි පත්‍ර මත ඇතිවේ. ක්‍රමයෙන් පුල්ලි විශාල වේ. පුල්ලි වලට නියමිත හැඩයක් නැත. පුල්ලි මැද දුඹුරු පාට විය හැක. ඔරොත්තු දෙන වර්ගවල පුල්ලි විශාල නොවන අතර, පත්‍රයේ

ගිලුනු පුල්ලි වශයෙන් ඇත. ගෙඩි සහිත ගෝවා පැල වලට රෝගය වැළඳුන විට ගෝවා ගෙඩියට රෝගය නොවැළඳේ. බෙගෝ හා ඩැකොනිල් දිලීර නාශක රෝග ලක්ෂණ දුටු වහාම වගාවට යෙදී මෙන් රෝගය මර්ධනය කල හැකි වේ.

### 3. පත්‍ර පුල්ලි රෝගය (සර්කොස්-පොරා බ්‍රැසිකෝලා දිලීරය)

අඳුරු අළුපාට මැද කොටස් හා ලා දුඹුරුපාට මායිම් ඇති පුල්ලි මේරු පත්‍රවල ඇතිවේ මෙම පුල්ලි ක්‍රමයෙන් විශාලවන අතර, ඒවායේ මධ්‍යයේ අළු හා තද දුඹුරු වලයාකාර ස්වභාවයක් ගනී. දරුනු ලෙස රෝගයට පාත්‍රවූ විට මේරු පත්‍ර මැරී යයි.

රෝගය පැතිරීම වැලකීමට සියළුම රෝග පත්‍ර එකතු කර ගිණි තියා විනාශකල යුතු වේ. මැන්කොසෙබ්, වොන්ඩර් සෙබ්, පොලිරම්, එම්, හෝ ඇන්ත්‍රකෝල් වැනි දිලීර නාශකයක් රෝග ලක්ෂණ පලමුවෙන් දුටු විට යෙදීමෙන් රෝගය සාර්ථකව මර්ධනය කර ගත හැක.

### 4. ගෝවා කළු කුණුවීම (සැන්තමෝනාස් කැම්පෙස්ට්‍රිස් බැක්ටීරියාව)

ඉංග්‍රිසි 'වී' අකුරේ හැඩය ඇති කහ පාටට හුරු දුඹුරු පාට රෝගී ප්‍රදේශ ගෝවා පත්‍රවල දර අසල පලමු රෝග ලක්ෂණ ලෙස දක්නට ලැබේ. රෝගය තව දුරටත් පැතිරීමේදී එම පත්‍රයේ නාරටි කළු හෝ තද දුඹුරු පැහැ ගැන්වීමක් සිදුවේ. අවසානයේදී පත්‍ර හැලෙන අතර, නටුව කඳට සම්බන්ධවන ස්ථාන යේද කළුවී තිබෙනු දක්නට ලැබේ.

රෝග මර්ධන සඳහා දිගු කාලීන බෝග මාරුව, බීජ පැරන්හයිට් අංශක 120 උනු වතුරේ මිනිත්තු 30 ක් ගිල්වා තැබීම නිර්දේශිතයි. රෝග ලක්ෂණ පලමු දක්ක විට රෝගී ශාඛ කොටස් වගාවෙන් ඉවත් කොට, වගාවට තඹ අඩංගු (වෙළෙඳ නම් කුප්රාවිට්, කොපර් පැන්ඩොස් හා පෙරනොක්සි) දිලීර නාශක යෙදීම මගින් රෝගය මර්ධන කල හැකිවේ.

### අස්වනු නෙලීම

වගා කරන ප්‍රභේදය අනුව අස්වනු නෙලිය යුතු කාලය වෙනස් වේ. ගෝවා ගෙඩිය හොඳින් වර්ධනය වී ඇති නම් එම ප්‍රභේදයට ආවේනික තද බව හා පත්‍ර ඇසිරී තිබීමේ ආකාරය එහි තිබිය යුතුවේ. මේ අවස්ථාවේදී අස්වනු නෙලීම පමා කල හොත්, ගෙඩි පිපිරීමට පටන් ගෙන ඒවායේ වෙළෙඳ පොල වටිනාකම නැතිවේ. අස්වනු නෙලීම විශාල වගාවක එකවිට හෝ කීප වතාවකදී සති 1—2 තුලදී කල හැක. පලමුව විශාල ගෙඩිවල අස්වනු නෙලීම කරනු ලැබේ. පසුව දින 6 කට වරක් දෙවතාවක් පමණ අස්වනු නෙලා ගැනීමට හැකිවේ. නමුත් අස්වනු නෙලන කාලයේ තද වර්ෂාවක් ඇති වන්නේ නම් ගෙඩි පිපිරීමට හැකියාව වැඩි නිසා ගොවීන් එක වර අස්වනු නෙලනු ලැබේ.

අස්වනු නෙලීමේදී පිටතින් පත්‍ර වලයන් දෙකක් ඉතිරිකර ගෙඩි කපා ගත යුතු වේ. මෙසේ පත්‍ර වලයන් දෙකක් ඉතිරි කිරීම ප්‍රවාහනයේ දී ඇතිවන හානි වලින් ගෙඩිය ආරක්ෂා කරයි. කැපූ විගස ගෝවා ගෙඩිය කැපූ ස්ථානය ඉහලට සිටින සේ ක්ෂේත්‍රයේ තැබී මෙන් කැපූ පෘෂ්ඨය මත පස් ගැටීමෙන් වලකී. දුල් ගෝණිවල අසුරා ගෝවා ප්‍රවාහනය කරනු ලැබේ.

### අස්වැන්න

අස්වැන්න අක්කරයකට ටොන් 14-20 අතර වේ. මෙය වගා කරන ප්‍රභේදය හා වගා කරන ප්‍රදේශය අනුව වෙනස් වේ. උඩරට ප්‍රදේශ යන්හි අධික අස්වනු ලැබේ.

---

## අලෙවියෙන් පෝෂණය රැකගනිමු . . . .

(31 වෙනි පිටුවෙන්)

සාමාන්‍යයෙන් දිනකට පුද්ගල යෙකු පරිභෝජනය කරන්නේ එළවළු ග්‍රෑම් 105 කි. 1973 පරිභෝජන මූල්‍ය සමීක්ෂණයට අනුව පුද්ගලයෙකු පරිභෝජනය කරන් නේ දිනකට එළවළු ග්‍රෑම් 62 කි. මාළු ගැන සලකා බලන විට පුද්ගලයෙකු මාළු රාත්තල් 48 ක් අවුරුද්දකට පරිභෝජනය කළ යුතු වුවත් 1982 දී එක් පුද්ගලයකු පරිභෝජනය කර ඇත්තේ රාත්තල් 32 කි.

මේ සංඛ්‍යා ලේඛණ වලින් පෙනී යන්නේ පවතින ඒක පුද්ගල පරිභෝජනය ප්‍රශස්ථ පෝෂණ මට්ටම සඳහා ප්‍රමාණවත් නැති බවයි. පවත්නා පරිභෝජන මට්ටම ප්‍රශස්ථ මට්ටමට ගෙන ඒමේ ක්‍රියාවලියේදී අලෙවිය ඉතා වැදගත් තැනක් ගනී. ඒ නිසා දනට පවතින අලෙවි රටාව කාර්‍යක්ෂමව ගොඩනැංවිය යුතුය. වෙළඳපලට අවශ්‍ය විදියට භාණ්ඩ නිපදවිය යුතුය. කාර්යක්ෂම විදියට ඒවා ගබඩා කර භාණ්ඩ හිඟයක් ඇති නොවන සේ ඒවා බෙද හැරිය යුතුය. අනවශ්‍ය අලෙවි වියදම් අඩු කිරීමට භාණ්ඩවල අපතේ යාම අඩුකල යුතුය. ප්‍රවාහනය, ආහාර පිළියෙල කිරීම, භාණ්ඩ පැටවීම, බෑම නවීකරණය කළ යුතුය.